# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## ප්‍රධාන ගණකාධිකාරී තනතුර

ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගණකාධිකරණය පිළිබඳ උපාධියක්

සහ

පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනවල පූර්ණ සාමාජිකත්වය

සහ

සමාන ක්ෂේත්‍රයක වසර 10 ක පළපුරුද්ද

සහ

- අදාළ ක්ෂේත්‍රය සඳහා ශාස්ත්‍රපති (Master's) උපාධිය අමතර සුදුසුකමක් වේ.

**වයස :** අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට අඩුවිය යුතුය. (වයස අවුරුදු 50 ට අඩු අයදුම්කරුවන් නොමැති නම් වයස අවුරුදු 50 ට වැඩි, අවුරුදු 55 ට අඩු අයදුම්කරුවන් සළකා බැලේ).

**වැටුප් පරිමාණය :** රු. 102,810-16X2,930-149,690/- මාසිකව

**රැකියා පැතිකඩ :** මෙම තනතුර ප්‍රතිඵල දිශානතිගාමී ස්වයං - විශ්වාසී අයෙකු සඳහා වන අතර, ඔහු රෝහලේ මූල්‍ය අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ යුතුවේ. එමෙන්ම ගිණුම්කරණය, අයවැය සැකසීම, මූල්‍ය සැලසුම් හා ගබඩා කළමනාකරණ කටයුතු පිළිබඳව වගකීම දරයි..

**රැකියාවේ නියමයන් :** ස්ථිර හා අර්ථසාධක අරමුදල් පදනම.

රජයේ සේවයේ තනතුර හොබවන අයදුම්කරුවන් තමන් සේවය කරන ආයතන ප්‍රධානීන් මගින් තම අයදුම්පත් යොමු කළ යුතු අතර, පිටපතක් සෘජුව ඉදිරිපත් කළ යුතුය.

පත්වීම සඳහා තෝරාගත හොත් අයදුම්කරු මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානිගේ සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

පත්වීමක් සිදුකිරීමේ / නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

අයදුම්කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහිත අයදුම්පත් 2024 අප්‍රේල් 29 දිනට හෝ ඊට පෙර එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
2024-04-09